# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 806/2 — 1994 පෙබරවාරි 15 වැනි අඟහරුවාදා — 1994.02.15

806/2 ஆம் இலக்கம் — 1994 ஆம் ஆண்டு பெப்புருவரி மாதம் 15 ஆம் திகதி செவ்வாய்க்கிழமை

No. 806/2 – TUESDAY, FEBRUARY 15, 1994

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)


## IV (අ) වැනි කොටස — පළාත් සභා

### පළාත් සභා නිවේදන

**සබරගමුව පළාත් සභාව**

සබරගමුව පළාත් සභාවේ 1993 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ : 1993 අගෝස්තු මස 11 වැනි දින.

අනුමැතිය ලැබුණේ : 1993 අගෝස්තු මස 25 වැනි දින.

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

එම්. එම්. යූ. ධම්මික,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

*1990 අංක 06 දරන සබරගමුව පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.*

සබරගමුව පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ :—

1. මේ ප්‍රඥප්තිය 1993 අංක 01 දරන සබරගමුව පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. 1990 අංක 06 දරන සබරගමුව පළාතේ මුදල් ප්‍රඥප්තියේ දීර්ඝ නාමය, එහි " මුද්දර ගාස්තු පනතේ ඇතැම් විධිවිධානවලට අනනුකූල වේ. " යන වචනය ඉවත් කොට, ඒ වෙනුවට, " මුද්දර ගාස්තු පනතේ සහ සංශෝධිත පරිදි වූ සුරාබදු පනතේ සහ සංශෝධිත පරිදි වූ මහ නගර සභා ආඥාපනතේ සහ සංශෝධිත පරිදි වූ නගර සභා ආඥාපනතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ඇතැම් විධි විධාන වලට අනනුකූල වේ." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. *1990 අංක 06 දරන සබරගමුව පළාතේ මුදල් ප්‍රඥප්තියේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.*

3. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වූ විටක, සිංහල භාෂා පාඨය බලපවත්වන්නේය. *අනනුකූලතාවක් ඇති වූ විට සිංහල පාඨය බලපැවැත්වීය යුතු බව.*

## සබරගමුව පලාත් සභාව

සබරගමුව පලාත් සභාවේ 1993 අංක 02 දරන මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ : 1993 අගෝස්තු මස 11 වැනි දින.

අනුමැතිය ලැබුණේ : 1993 අගෝස්තු මස 25 වැනි දින.

සබරගමුව පලාත් සභාවේ නියමය පරිදි,

එම්. එම්. ශු ධම්මික,
සභා ලේකම්,
සබරගමුව පලාත් සභාව.

***1990 අංක 06 දරන සබරගමුව පලාතේ මුදල් ප්‍රඥප්තිය යටතේ එකතු කරන ලද මුද්දර ගාස්තු සබරගමුව පලාතේ පලාත් පාලන ආයතනවලට හැරවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.***

සබරගමු පලාතේ පලාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

1. මේ ප්‍රඥප්තිය 1993 අංක 02 දරන සබරගමුව පලාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

**මුද්දර ගාස්තු හැරවීම.**

2. 1990 අංක 06 දරන සබරගමුව පලාතේ මුදල් ප්‍රඥප්තිය සහ 1992 අංක 03 දරන සබරගමුව පලාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ප්‍රකාර, පලාත් සභාව විසින් සබරගමුව පලාතේ යම් පලාත් පාලන ආයතනයක පරිපාලනය සීමා ඇතුළත පිහිටි යම් නිශ්චල දේපළක් පැවරීම සම්බන්ධයෙන් වූ යම් සාධන පත්‍රයක් වෙනුවෙන් යම් මුද්දර ගාස්තුවක් අයකර, එකතු කර, සබරගමුව පලාතේ පලාත් සභා අරමුදලට ගෙවා ඇති අවස්ථාවක, පලාත් සභාව විසින් ඒ මුද්දර ගාස්තුව අයකර එකතු කරනු ලැබුවේ යම් නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන් ද, ඒ නිශ්චල දේපළ පිහිටා ඇත්තේ යම් පලාත් පාලන ආයතනයක පරිපාලන සීමාවක් ඇතුළත ද, ඒ පලාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධරයා විසින්, ඉහත කී පරිදි ඒ මුද්දර ගාස්තුව අයකර, එකතු කරන ලද වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින සිට අවුරුදු 02ක් වූ කාල සීමාවක් ඇතුළත, සබරගමුව පලාතේ පලාත් අමාත්‍ය මණ්ඩලයේ මුදල් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් හිමිකමක් ඉදිරිපත් කරන ලද විට, පලාත් සභාව විසින් ඒ පලාත් පාලන ආයතනයට ඒ මුද්දර ගාස්තුවේ මුදල හැරවිය හැකිය.

**රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ සහතිකය.**

3. 2 වැනි වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද කිසිම හිමිකමක්, ඒ හිමිකමෙහි සඳහන් කරන ලද මුද්දර ගාස්තු ගෙවීම පිළිබඳව, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් ඔහු වෙනුවෙන් නම් කරන ලද වෙනත් යම් නිලධරයකු විසින් සහතික කරන ලද, උපලේඛනයක් ඒ හිමිකම සමඟ ඉදිරිපත් කරනු නොලැබුවහොත්, වලංගු නොවන්නේය.

**අර්ථ නිරූපණය.**

4. මේ ප්‍රඥප්තියෙහි පද සම්බන්ධයෙන් අනතාර්ථයක් අවශ්‍ය කළහොත් මිස —

" ප්‍රධාන පරිපාලන නිලධරයා " යන්න —

(අ) මහ නගර සභාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් එහි නාගරික කොමසාරිස්වරයා ; සහ

(ආ) නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් එහි ලේකම්වරයා

අදහස් වේ.

" පලාත් පාලන ආයතනය " යන්නෙන්, යම් මහ නගර සභාවක් නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර එවැනි සභාවක් විසින් ක්‍රියාත්මක කරන සහ ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන හෝ සමාන වන බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා පිහිටුවනු ලබන වෙනත් යම් අධිකාරියක් ද ඊට ඇතුළත් වේ.

" සාධන පත්‍රය " යන්නෙහි, 1990 අංක 06 දරන සබරගමුව පලාතේ මුදල් ප්‍රඥප්තියේ ඇති අර්ථයම ඇත්තේය.

" පලාත් සභාව " යන්නෙන්, ශ්‍රී ලංකා ජනරජයේ සබරගමුව පලාතේ පලාත් සභාව අදහස් වේ.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල පාඨය බලපැවැත්විය යුතු බව.**

5. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර අනනුකූලතාවක් ඇති වූ විටක, සිංහල භාෂා පාඨය බල පවත්වන්නේය.

03 – 23/2